*මානවශාස්ත්‍ර අධ්‍යයන, 1999 (1), පිටු 89-105.*

# පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනවලින් හෙළිවන ලක්දිව පැරණි ස්ථානනාම

චන්ද්‍රන රෝහණ විතානාච්චි

ඓතිහාසික මූලාශ්‍ර වශයෙන් ශිලා ලේඛනවල පවතින වටිනාකම අනිකුත් සාහිත්‍යයික මූලාශ්‍රයන්ගේ වටිනාකමට දෙවෙනි නොවේ. ඇතැම් විට පැරණි ලිපි ලේඛන ආශ්‍රයෙන් ශ්‍රී ලංකාවේ අතීත සමාජ තත්ත්වය විමර්ශනය කරනවිට, ඒ අතර, ප්‍රධාන විශ්වාසදායි සාධකයක් වශයෙන් ශිලා ලේඛන හැඳින්විය හැකි ය. ශිලා ලේඛන සම්පූර්ණ ඓතිහාසික මූලාශ්‍ර නොවන බවද සැලකීම වැදගත් ය. ග්‍රන්ථාරූඪ වූ සාහිත්‍යයික මූලාශ්‍රයන්හි පවතින අඩු පාඩු සකස් කිරීම, අතිරික්ත එකතු කිරීම, වැරදි නිවැරදි කිරීම වැනි කටයුතු සඳහා ශිලා ලේඛනවලින් නොමඳ සහායක් ලැබේ.

ශිලා ලේඛනයක පවතින වටිනාකම වන්නේ එහි ඇතුළත් තොරතුරු සමග එය සමකාලීන වීමයි. සාමාන්‍යයෙන් සෙල්ලිපිවල ඇතුළත් බොහෝ කරුණු කෙරෙහි විශ්වාසය තැබිය හැකි ය. එසේ වුව ද, විවිධ වූ සැකයන් උපදින අවස්ථා ද නැත්තේ නොවේ.[1] එවැනි ලේඛන පිළිබඳව තීරණ ගැනීමේ දී වඩා පරීක්ෂාකාරිවීම පර්යේෂකයෙකුගේ වගකීම වේ. අන්තර්ගතවන තොරතුරු හා සමකාලීන නොවන ශිලා ලේඛන ද තිබෙන අතර, ඒවායේ බොහෝ විට සඳහන් වනුයේ ශිලා ලේඛනය කරන අවස්ථාවට පෙර වූ සිදුවීම් ය. සාහිත්‍ය කෘතියක මෙන් පූර්ව කාලීන සිදුවීම්, ලේඛකයාගේ අභිරුචිය හා පවතින දේශපාලන පසුබිම මත නැවත සකස් වීමෙන් තොරව අදාලවන සමකාලීන සිදුවීම පමණක් කෙටියෙන් ස්ථිර ලෙස ගලක සටහන් කිරීම නිසා ශිලා ලේඛනයක පවතින විශ්වාසනීයත්වය පුළුල් වෙයි.

ලක්දිව ශිලා ලේඛන ආරම්භවීමට මූලික පසුබිම වී ඇත්තේ දේවානම්පියතිස්ස රජුගේ (ක්‍රි. පූ. 250-210)[2] කාලයේ දී සිදුවූ මහින්දාගමනය හා එහි ප්‍රතිඵලය ලෙස බුදු දහම නිත්‍යානුකූල ලෙස මෙරට ස්ථාපිත වීමයි.[3] මේ සෙල්ලිපි කරවීමේ ප්‍රධාන අදහස හා තේමාව වී ඇත්තේ බුදුදහම වැළඳගත් කිසිවෙකු හෝ විසින් භික්ෂූන්ට කරන ලද පරිත්‍යාගයක් සටහන් කර තැබීම ය. බුදුදහම මෙරටට පැමිණ ස්ථාපිත වූ ක්‍රි. පූ. තුන්වන ශතවර්ෂයේ අපරභාගයේ සිට මෙවැනි ලිපි දක්නට ලැබේ. ලංකාවේ පැරණි ම ශිලා ලේඛන හමුවන්නේ මිහින්තලය, වෙස්සගිරිය, ආදී ස්ථානවලින් ය.[4] එසේ වුව ද, මිහින්තලේ ඇති ශිලා ලේඛන සමහරක් මේ අතරින් වඩාත් පැරණි බව පෙනේ. ක්‍රි.පූ. තුන්වන සියවසේ දෙවනපැතිස් යුගයේ සිට ම ලියන ලද සෙල්ලිපි තිබුණත් ඒවා නිශ්චිතව ම දෙවනපැතිස් රජුගේ ම යැයි කිව නොහැක්කේ එම අභිදාන පාඨය භාවිතා

කළ තවත් රජවරු සිටි බැවිනි. එනමුදු අක්ෂරවල පවතින ලක්ෂණ සලකා බලා මිහින්තලේ ඇති "දෙවනපිය මහරකඩහ"[5] යනුවෙන් ද "මහරකඩහ ගමිණි තිශහ"[6] ලෙස සඳහන් ලිපි දෙක ඔහුගේ ම ලිපි බව මහාචාර්ය පරණවිතානයන්ගේ විශ්වාසය යි. නමුත් නිසැක ලෙස ම මේ කරුණ සඳහන් පැරණි ම ලිපිය ලෙස දෙවනපෑතිස් රජුගේ සහෝදරයකු වන උත්තිය මහරජුගේ මිහින්තලා සෙල්ලිපිය ගත හැකි ය. එහි උත්තිය රජුගේ නාම "ගමණි උති දෙවනපිය" යනුවෙන් සඳහන් කර ඇත.[7] මේ ආකාරයෙන් ඇරඹුණු දේශීය ශිලා ලේඛන නිර්මාණය නූතනය දක්වාත් පැවත එන්නේ ගලේ කෙටූ අකුරක තිබෙන ස්ථිරභාවය පිළිබඳව පවතින විශ්වාසය නිසා ම විය හැකි ය.

ක්‍රි. පූ. තුන්වන ශතවර්ෂයේ සිට ක්‍රි. ව. පළවන ශතවර්ෂය පමණ කාලය තුළ ලියැවුණු සෙල් ලිපි, ආදී බ්‍රාහ්මී හෙවත් පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන (Early Brahmi Inscription) ලෙස සැලකේ. මේ සෙල්ලිපි දෙවර්ගයේ මූලික වෙනස වන්නේ මුල් සෙල්ලිපි මගින් කෙටියෙන් තොරතුරු දක්වා තිබීමත්, දෙවන වර්ගයේ වඩා දීර්ඝ ලෙස කරුණු සඳහන් කර තිබීමත් ය. එසේ නමුත් ලිපි දෙවර්ගයේ ම වස්තු විෂයය අතර වෙනසක් දක්නට නොලැබේ. මේ සෙල් ලිපි දෙවර්ගයෙ ම පොදුවේ ගත්විට "බ්‍රාහ්මී ශිලා ලේඛන" ලෙස හඳුන්වනු ලැබේ.

මේ ශිලා ලේඛන කරවීමේ මූලික අරමුණ වූයේ "දාන" හා "ප්‍රදාන" පිළිබඳව සඳහන් කිරීම වුව ද ඒවායේ සඳහන් තොරතුරු මගින් සමකාලීන සමාජය පිළිබඳව පුළුල් ලෙස අධ්‍යයනය කිරීමට හැකිවීම ලිපිවල වටිනාකම වැඩිකරලීමට ප්‍රධාන හේතුවක් වේ. සමකාලීන දේශපාලනික පසුබිම, රජවරුන්ගේ ඓතිහාසිකත්වය හා හැඳින ගැනීම සහ පාලන තන්ත්‍රය පිළිබඳව බොහෝ කරුණු බ්‍රාහ්මී ශිලා ලිපිවලින් ලබාගත හැකිය.[8] තවද රටේ පැවති ආර්ථික තත්ත්වය, සමාජ ශ්‍රේණි හා ස්ථාන නාම හඳුනාගැනීම පිළිබඳව ද ඒවායේ ඇතුළත්වන කරුණු බොහෝ ය.

මේ විමර්ශනයේ මූලික පරමාර්ථය වන්නේ ක්‍රි. පූ. තුන්වන සියවසේ සිට ක්‍රි. ව. දෙවන සියවස දක්වා වූ කාලය තුළ ලිය වී ඇති බ්‍රාහ්මී ශිලා ලේඛන උපයෝගී කරගෙන පැරණි ලංකාවේ ස්ථානනාම හඳුනාගැනීම සඳහා එම සෙල්ලිපි මගින් ලැබෙන පිටිවහල පිළිබඳව කරුණු පරීක්ෂා කිරීම ය. මෙහිදී ස්ථානනාමයන් ලෙස හඳුන්වන්නේ කිසියම් භූමි ප්‍රදේශයක් හඳුනා ගැනීම සඳහා යොදනු ලැබූ නමකි. ලංකාවේ පුරාණ ස්ථානනාම පිළිබඳව විමසීමේ දී ආර්යාගමනයට පෙර සිට ම "ලංකානගර" ආදී වශයෙන් හැඳින්වූ ප්‍රදේශ තිබුණු බව **මහාවංශයට** අනුව පැහැදිලි වේ.[9] ආර්යාගමනයට පසු පිහිට වූ ප්‍රථම නාමික ස්ථානය වන්නේ "තාම්‍රපර්ණි" නම් නගරයයි.[10] **මහාවංශයට** අනුව එම නම යෙදී ඇත්තේ භූමියෙහි පසේ තඹවන් වර්ණය හේතුකොට ගෙන ය.[11] ඉන් පසුව පැමිණි විවිධ සංක්‍රමණික පිරිස් තමන්ගේ නම් අනුව ගම් පිහිටුවීම පිළිබඳව **මහාවංශයෙන්** තොරතුරු ලබාගත හැකි ය.

> අනුරාධ නම් ඇමති තෙමේ කොළොම් හෝ ඉවුරෙහි අනුරාධ නම් ගම පිහිටු විය. පෙරවි උපතිස් තෙමේ අනුරාධපුරයෙන් උතුරුදිග ගම්භීර නදී තීරයේ උපතිස්ස ග්‍රාමය ඉදි කළේ ය. අනික් ඇමතියෝ තුන් දෙනෙක් උදේනිය, උරුවේලාය, එසේම විජිතනගර යන වෙන ගම් ඉදි කළෝ ය.[12]

මේ ආර්ය සංක්‍රමණ හේතුවෙන් දිවයින පුරා මෙලෙස ගම් නගර ඉදිවූ බව වංශ කථා මූලාශ්‍රවලින් මෙන්ම ශිලා ලේඛනගත සාධකවලින් ද පැහැදිලි වේ. ලක්දිව ප්‍රථමයෙන්ම සංවිධානාත්මකව ගොඩනැගුණු නගරය වූ අනුරාධපුරයට[13] පසුව ස්ථිර ලෙස පිහිට වූ නගරය හා ගම් පිළිබඳව තොරතුරු රාශියක් ශිලා ලේඛනවලින් ලබාගත හැකි ය.

පුරාණ ගම හා නගරය අතර පවතින සංසන්දනාත්මක වෙනස පිළිබඳ අවබෝධය මෙහිදී වැදගත් වේ. ගමක් යනුවෙන් පළමුවෙන් ම අපේ සිහියට නැගෙන්නේ විශේෂ භූමි භාගයකි. ඒ ඒ ගමේ පිහිටීම ස්වාභාවික තත්ත්වයට අනුව වෙනස් වේ. ජලය, ආහාර සම්පාදනය අනුව වියළි කලාපයේ ගම් සකස්වීම මෙයට නිදසුනකි.[14] සෑම ගමකට ම නිශ්චිත භූගෝලීය සීමාවක් තිබේ. ඒ සීමාව නදියක්, මාර්ගයක්, මූකලානක් වැනි පැහැදිළි ලකුණක් විය හැකි ය.[15] පළමු සංක්‍රමණයෙන් සියවසකට පසු පණ්ඩුකාභය රජු විසින් ගම් මායිම් නියමකරන ලද බව **මහාවංශය** කියයි.[16] ගමක් සරල සමාජ සංවිධාන රටාවකින් යුක්ත විය. පුරාණයේ ගම නිර්මාණයවීම උදෙසා වැව ප්‍රධාන සාධකයක් බවට පත් වී තිබේ. වැව කේන්ද්‍ර කරගෙන අන්‍යොන්‍ය ඥාති සම්බන්ධතාවන් සහිත පවුල් කිහිපයක් මගින් ආදී ග්‍රාම ප්‍රජාවගේ ආරම්භය සිදු විය. මෙවැනි ගමක පරිපාලන රටාව ද වඩා සරල වූ අතර, රජුගේ නීති රීති ක්‍රියාත්මක කිරීම සඳහා ගම් ප්‍රධානියකු එම පවුල් අතරින්ම තෝරා ගන්නා ලදී. ඔහු "ගමික" හෝ "පරුමක" ලෙස හැඳින්විණි. ගමේ භූමිය වැදගත් වූ අතර එය එක් පවුලකට පොදුවූවක් නොවී ය. එක කොටසක් එක පවුලක් වශයෙන් භුක්ති විඳින ලදී.[17] ගමක ප්‍රධාන ලක්ෂණය වූයේ සාමූහික ක්‍රියාකාරකමයි. ගමේ පරිභෝජන රටාව ගමේ නිශ්පාදන ව්‍යුහය මත සකස් වූවක් විය. නිශ්පාදන අතිරික්තය නගරයේ අවශ්‍යතාවයන් සඳහා ලබාදී තිබේ. භූමි පිහිටීමේ ලක්ෂණ,[18] ඓතිහාසික සිදුවීම්, ජනප්‍රවාද, විශේෂ සිදුවීම්[19] යනාදි නොයෙක් හේතු ගමක නම නිර්මාණයවීම කෙරෙහි බලපා ඇත.

ග්‍රාම රාශියකින් සැදුම්ලත් විශාල ප්‍රදේශයකට සේවය සැපයිය හැකි වඩාත් සංවිධානාත්මක පරිපාලන රටාවකින් සමන්විතව, ස්ථාවර භූමියක බිහි වූ ජනාවාසය නගරයක් ලෙස හැඳින්වේ. නගරයක් ලෙස පසුව සංවර්ධනය වී ඇත්තේ මුල්කාලයේ දී ග්‍රාමයන් ලෙස පැවති ප්‍රදේශ බව **මහාවංශයෙන්** හෙළිවේ. අනුරාධපුර මුලින් අනුරාධගාම ලෙස ද, විජිතනගර මුලින් විජිතගාම ලෙස ද හැඳින්වී ඇත.[20] නගරයක ප්‍රධාන ලක්ෂණය වන්නේ ක්‍රමාණුකූලව සියළු අවශ්‍යතාවයන් ඒකරාශි වීම ය. පණ්ඩුකාභය රජු විසින් පිහිටුවන ලද ප්‍රධාන සංවිධානාත්මක නගරය වූ "අනුරාධපුරය" නිර්මාණය කිරීමේ දී ඔහු විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගයන් පිළිබඳව **මහාවංශයෙන්** තොරතුරු ලබාගත හැකිය.[21] එහි ක්‍රමාණුකූල මාර්ග, ස්ථාවර ගොඩනැගිලි නිර්මාණය විය.[22] නගරයක ජනතාව එකම ඥාති පිරිසක් නොවි ය. විවිධ සමාජතලවලට හා ශ්‍රේණිවලට ඔවුන් අයත් විය. නගරය වඩා පහසුකම් සහිත වුව ද, නගරයක් යැපුණේ ගම් ප්‍රදේශ මගින් නගරයට සපයන ලද අතිරික්ත නිශ්පාදන මගිනි. නගරයක පැවති තවත් ලක්ෂණයක් වූයේ එහි සුරක්ෂිතභාවයයි. **මහාවංශයට** අනුව "විජිත නගරය" දිය අගල් තුනකින් හා ද්වාර සහිත උස් තාප්පයකින් ද ආරක්ෂාවී තිබිණ.[23]

බ්‍රාහ්මී ශිලා ලේඛනවල දැක්වෙන ස්ථානනාම අතර නගර, ග්‍රාම හා වාරිනාමයන් ප්‍රධාන තැනක් ගනී. එම නාම කුමන ස්ථානයක් හැඳින්වීම සඳහා භාවිතා කරන ලද්දේ ද යන්න එම නාමයෙන් ම හඳුනා ගැනීමට පිළිවන. ස්ථානනාම හඳුනාගැනීම හා ඒවායේ වාසය කරන පුද්ගලයන් පදිංචිව සිටි ආකාරය හඳුනාගැනීමට පිටිවහල් වන කරුණු පහක් මහාචාර්ය පරණවිතානයන් දක්වා තිබේ.[24]

i. ශිලා ලේඛනයක ස්ථානනාමයන් දක්වා ඊට පසුව "වසික, වශික" යන පද යෙදීම: මේ වචනයේ අර්ථයට අනුව එහි සඳහන්වන පුද්ගලයා එම නාමය සහිත ප්‍රදේශයේ එක්

වැසියෙක් ය යන අර්ථය සඳහා පමණක් ම යෙදේ. "උපලවි වසිත"[25] හෙවත් උපලවි හි වාසය කරන හා "චනතිශ පවත වශික"[26] හෙවත් චන්න තිස්ස පර්වතයේ වාසය කරන යන අරුත ගෙන දෙන ලෙස යෙදෙන්නේ මේ ක්‍රමයට ය.

ii ස්ථානයේනාමයට පසුව "ගමික හෝ බුජික" යන පදයන් යෙදීම: මෙහිදී "ගමික" යන්නෙන් ගම කරන හෙවත් ගමේ ප්‍රධානියා යන අර්ථයත්, "බුජික" යන්නෙන් ගමේ දේපල පරිහරණය කරන යන අර්ථයත් ලැබේ. මේ පද භාවිතා කරන පුද්ගලයින්ට ගමේ අයිතිය හෙවත් උරුමය පවතින බව විශ්වාස කෙරේ. "දෙව පුත ගමික"[27] හෙවත් දේව පුත්ත ගමේ ප්‍රධානියා හා "මාතුකගම බුජිකෙ"[28] හෙවත් මාතුකගම දේපල හිමි යන්න නිදසුනකි.

iii. ස්ථානනාමයකට පරව "පුගියන හෝ නගරියාන" යන පදයන් යෙදීම: මේ වචනද්වයෙන් "සමූහ" යන අර්ථය ලැබේ. එනම් මේ ලිපිවල එක පුද්ගලයකුගේ නමක් සඳහන් නොවන අතර එමඟින් ප්‍රදේශයේ වසන අය පොදුවේ කළ පිදීමක් පිළිබඳව සඳහන් වේ. "අලිපවති පුගියන"[29] හෙවත් අලිපවති ප්‍රදේශයේ පදිංචි අය හා "උති නගරියන"[30] හෙවත් උතිනගරයේ පදිංචි අය ආදී වශයෙනි.

iv. කිසියම් වැවක නමකට පසුව "හමික" යන පදය යෙදීම: මෙම පදයෙන් හිමි හෙවත් අයත් යන අර්ථය ගෙන දේ. රාජකීයයන් හැරුණු විට ස්වාධීනව වැව්හිමි පුද්ගලයින් එම වැවේ නමක් සමග යෙදීමේ දී මේ පදය භාවිතා කරන ලදී. "කදපි වපි හමික"[31] හෙවත් කදපි නම් වැවේ හිමිකරු ආදී වශයෙනි.

v. ස්ථානනාමයකට පරව "නැවිකස" යන පදය යෙදීම: මෙයින් අර්ථ ගැන්වෙන්නේ එම පදය සමග යෙදෙන පුද්ගලයා නාවිකයකු වන බවත් මුලින් සඳහන් ස්ථානනාමය ඔහු යාත්‍රා කරන වරායේ නම වන බවත් ය. "බෝජකටස නවිකස පදගදිනි"[32] නම් ලිපියේ බෝජකටකයට යාත්‍රා කරන නාවිකයෙකුගේ පඩිපෙළක් පිළිබඳව සඳහන්වීම දැක්විය හැකි ය.

මේ කරුණු පහට අමතරව ද ස්ථානනාම යෙදී ඇති බව ශිලා ලේඛන පරීක්ෂා කිරීමේ දී පෙනීයයි. විශේෂයෙන් ම උපයෝගිතාව, සමාජ තත්ත්වය වැනි කරුණු ද මේ කෙරෙහි බලපා ඇති බව පෙනේ. ස්ථානනාම පිහිටා ඇති ආකාරය අනුව එය සෙල්ලිපියේ කුමන අරුතක් සඳහා යොදා ඇති ද යන්න වටහා ගැනීම උදෙසා පිටිවහල් වන තවත් නව කරුණු හයක් හඳුනාගත හැකි ය.

i රාජකීය සම්බන්ධතාවයන්ගෙන් යුතු පිරිස්, ස්ථාන නාමයට පසුව තමාගේ රාජකීය තිලනාමය යෙදීම: මේ තිලනාම අතර රජ, අය වැනි නාමයන් ලේඛනවලින් හඳුනාගත හැකි ය. "කතරගම රකඩශ තිශහ"[33] හෙවත් කතරගම තිස්ස රජුගේ හා "ලොනපි අය ශිවශ"[34] හෙවත් ලොණපි හී තිස්ස කුමාරයා ආදී ලෙසිනි.

ii ස්ථානනාමයට පරව පුද්ගලනාමය යෙදීම: මෙහිදී එම නාමය සඳහන් පුද්ගලයා එම ප්‍රදේශයේ වැසියෙකු බව අනියමාර්ථයෙන් කියවේ. "පදගම දත තිපති දින"[35] යන ලිපියෙන් පදගම වාසය කරන දත්ත නම් පුද්ගලයෙකු පිළිබඳව සඳහන් වී තිබෙන්නේ ඒ ආකාරයට ය.

iii. ස්ථාන නාමයට පසුව "පටකෙ" යන පදය යෙදීම: මෙම පදයෙන් අර්ථ ගැන්වෙන්නේ කොටසක් යන්න ය. ප්‍රදේශයේ කොටසක් සංඝයා වහන්සේට හෝ විහාර නඩත්තුවක්වත් සඳහා පිදූ බව සඳහන් ලිපිවල මෙය යෙදී තිබෙනු දක්නට ලැබේ. යටහලෙන ලිපියේ සඳහන් "උපලිගමශි පටකෙ කවරගමශි පටකෙ..."(36) යන ලිපියට අනුව උපලිගමින් හා කවරගමින් කොටස බැගින් යන අර්ථය ලැබෙන්නේ මේ ආකාරයට ය.

iv. ස්ථානනාමයට පසුව "පතන" යන පදය යෙදීම: මේ පදය යෙදීම තුළින් පූර්වයේ පැවතියා වූ ස්ථානයක් (Former dwelling site) යන අර්ථ ගෙන දේ. "පඩුවාසගොඩ පතන"[37] යන ලිපි පාඨයට අර්ථ ගැන්වනේනේ පණ්ඩු වාසය කළ උස් ගොඩැල්ල යන්න ය.

v. ස්ථානනාමය අගට "ශි" හෝ "ය" ප්‍රත්‍ය යොදා එම ස්ථානයේ ම පදිංචි යන අර්ථය ලබා දීම: "ශි" ප්‍රත්‍යයෙන් "එහි" යන අර්ථයත් "ය" ප්‍රත්‍යයෙන් "වේ" යන අර්ථයත් ලැබේ. "තෙලගමශි"[38] යන්නෙන් තෙලගමෙහි යන අර්ථයත්, "තොටගමිය"[39] යන්නෙන් තොටගමේ යන අර්ථයත් ලබා දෙන්නේ යටකී ආකාරයෙනි.

vi. ස්ථානනාමයට පූර්වයෙන් නිලතල නාම යෙදීම: මෙලෙස ඇතැම් ප්‍රභූන් තමන් ට හිමි තිල නාමය ස්ථානයට ප්‍රථම යොදාගෙන තිබීම හඳුනාගත හැකි ය. "පරුමක බරුකවග මලහ"[40] යන පාඨයෙන් බරුකවගයේ ප්‍රමුඛ මලහා යන අදහස ගෙන දේ.

මේ ශිලා ලේඛනවල මුඛ්‍ය පරමාර්ථය වී ඇත්තේ විවිධ ප්‍රදානයන් පිළිබඳව දක්වාලීමයි. මේ ලිපිවලින් ලෙන්, ගම්මාන, කෙත්වතු, වැව් අමුණු ආදිය සංඝයා වහන්සේට හෝ විහාරස්ථානයකට පූජා කිරීම පිළිබඳව තොරතුරු ලබාගත හැකි ය. මේ ලිපිවල සඳහන් ස්ථාන එම ලිපිය පිහිටි ස්ථානයට සමීපව පිහිටා තිබෙන්නට ඇත. නමුත් සමහර අවස්ථාවල දී එම ප්‍රදානය කළ පුද්ගලයා එම ලිපිය පිහිටි ස්ථානයෙන් දුර බැහැර ප්‍රදේශයක පදිංචි වී සිටි අයකු වන්නට ඉඩ ඇති බැවින් එම ලිපියේ සඳහන් ස්ථානයට ලිපිය පිහිටි ස්ථානයට සමීප ස්ථානයක් නොවීමට ද ඉඩ ඇත.

ස්ථානනාමයක් නිර්මාණය වීම සඳහා මෙසේ විවිධ හේතූන් බලපා තිබේ. ග්‍රාමනාම සඳහා කිසියම් ක්‍රියාකාරකමක බලපෑම ලැබී ඇති බව ශිලා ලේඛනගත ස්ථානනාම පරීක්ෂා කිරීමේ දී පැහැදිළි වේ. ඒ අනුව පුද්ගලනාම, භූගෝලීය පරිසරය, ගෝත්‍රිකනාම, ආගමික බලපෑම, නක්ෂත්‍රය, කෘෂිකර්මය, වෘත්තීය කටයුතු, බුදුදහම, රාජකීයත්වය, ස්වභාව ධර්මය, ශාක හා සතුන්, විදේශීය බලපෑම ආදී හේතු රාශියක් යටතේ ස්ථානනාම බිහි වී ඇති බව පෙනේ.

පුද්ගලනාම උපයෝගී කරගෙන ස්ථාන හැඳින්වීම මුල් කාලයේ සිට ම පැවති බව පෙනේ. ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ සිදු වූ විජයාගමනයේ සිට ම පුද්ගලනාම මුල් කරගෙන ස්ථාන නාමයන් නිර්මාණය කර තිබෙන බව මූලාශ්‍ර ග්‍රන්ථවලින් හෙළිවේ. පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන කිහිපයකින් ම එවැනි ස්ථාන නාම හඳුනාගත හැකිය. පොළොන්නරුව මුතුගල ශිලා ලේඛනයක "දෙවපුත ගමික" යනුවෙන් සඳහන් වේ.[41] මේ අනුව මෙහි "දේවපුත්ත" නම් ගමක් පිළිබඳව

පැවසෙන අතර එය දේවපුත්ත නම් පුද්ගල නාමය මුල්කරගෙන නිර්මාණය වී ඇති බව පෙනේ. මාතලේ තිලගම ශිලා ලේඛනයේ "දුබලගම" යනුවෙන් සඳහන් වී තිබේ.[42] මෙහි සඳහන් වන්නේ නාමයකි. ධූමර යන සංස්කෘත පුද්ගල නාමයෙන් උපන් මෙය, ගම යන ස්ථාන වාචී පදය සමග සම්බන්ධවීමෙන් ඉහත නාමය නිර්මාණය වී ඇත. අම්පාර රජගල ලිපියක "චනතිශ පවත" යනුවෙන් සඳහන් වේ.[43] මෙය චන්න තිස්ස නම් පුද්ගල නාමය මුල් කරගෙන හා භූගෝලීය ලක්ෂණයක් වන පර්වත යන අදහස ඇති පර්වත යන නාමය සම්බන්ධ වීමෙන් සෑදී තිබේ. අම්පාර හෙනන්නේගල ශිලා ලේඛනයක "තිශගම හා කශබනගර" යනුවෙන් ස්ථාන නාමයන් දෙකක් සඳහන් වේ.[44] මෙයින් තිශගම යන්න තිස්ස නම් පුද්ගල නාමය මුල් කරගෙන බිහි වී ඇත. කශබනගර යන්න කස්සප නගරය ලෙස හඳුන්වා ඇත. සංස්කෘතයෙන් කාශ්‍යප ලෙස ද, පාළියෙන් කස්සප ලෙස ද, හෙළයෙන් කසුබ් ලෙස ද අර්ථ ගන්වා තිබේ.[45] ඒ අනුව එය කාශ්‍යප නම් පුද්ගලයකු විසින් ගොඩනගන ලද නගරයක් බව විශ්වාස කළ හැකි ය. කෑගල්ල යටහලෙන එක් ශිලා ලේඛනයක "උපලිගම" යනුවෙන් සඳහන් වී තිබේ.[46] ක්‍රිස්තු පූර්ව හයවන සියවසෙන් පසු ලංකාවට සංක්‍රමණය වූ ආර්යය ජන කාණ්ඩායම් තම ප්‍රධානියාගේ නම මුල් කරගෙන තමන් පදිංචි ප්‍රදේශය හඳුන්වා තිබේ.[47] මේ ලිපියේ සඳහන් "උපලිගම" යන ප්‍රදේශනාමය උපාලි නැමති ප්‍රධානියකු හෝ කණ්ඩායම් නායකයාගේ නම මුල් කරගෙන යොදන්නට ඇත. යටහලෙන තවත් ලිපියක "දුශතරගම" යනුවෙන් සඳහන් වේ. මෙය ද පුද්ගලනාමයක් මුල්කරගෙන බිහිවූවකි. මේ ප්‍රදේශයේ පාලනය ගෙන ගිය දුශතර නම් රජු හෝ ඔහුගේ පියාවන දුශතර කුමාරයා මුල් කරගෙන මේ ස්ථානනාමය බිහිවී තිබේ.[48]

ප්‍රදේශනාම නිර්මාණයවීම කෙරෙහි භූගෝලීය පරිසරය ද සම්බන්ධ වී තිබේ. අවට පරිසරයේ පවතින භූගෝලීය තත්ත්වයන්, පාරිසරික රටාවන් මේ කෙරෙහි බලපා ඇත. අනුරාධපුර අලියකඩ සෙල්ලිපියක "අලිපවති" යනුවෙන් ස්ථාන නාමයක් සඳහන් වේ.[49] පවති යන්නෙන් පබ්බත අර්ථය නැගෙන බැවින් එම ස්ථානය පර්වත ආශ්‍රිතව පිහිටා තිබුණු බව සිතිය හැකි ය. පුත්තලම තෝනිගල ලිපියෙහි "අවගිරික තිශ පවති" යනුවෙන් සඳහන් වී ඇත.[50] මේ ලිපියෙහි අච්චගිරික තිස්ස පබ්බත නම් ස්ථානයක් පිළිබඳව දැක්වේ. මේ සෙල්ලිපිය අසල පිහිටි පරමාකන්දේ තිබෙන පැරණි විහාරස්ථානය සහිත ප්‍රදේශය මේ ස්ථානය ලෙස හඳුනාගෙන ඇත.[51] පොළොන්නරුව, දිඹුලාගල, නාමල් පොකුණ ලිපියෙහි "කඩගිරික" නම් ස්ථානයක් පිළිබඳ සඳහන් වේ.[52] සිංහලයෙන් "කදාගිරි" ලෙසින් ද හැඳින්විය හැකි මෙයින් කහඳගිරි යන්න ද අර්ථ ගැන්විය හැක. කහඳ නම් පාෂාණ වර්ගයෙන් සෑදුන කන්දක් නිසා මේ නම ඇතිවන්නට ඇත. දැනුදු මේ ප්‍රදේශයේ විශාල වශයෙන් කහඳ පාෂාණ වර්ගය තිබීම ඉහත පුවත සනාථ කරන්නකි. අම්පාර හෙනන්නේගල ලිපියක "ගිරිතිශගම" යනුවෙන් සඳහන් වේ.[53] සංස්කෘත හා පාළියෙන් ද, හෙළයෙන් ද ගිරි යනුවෙන් සඳහන් වන්නේ කඳු සහිත භූමියකට ය. එලෙස කඳු සහිත ප්‍රදේශයක වාසය කළ තිස්ස නම් පුද්ගලයෙකු කේන්ද්‍ර කර මේ ග්‍රාම නාමය බිහි වන්නට ඇත. එම ලිපියෙහි ම "විලගම" යනුවෙන් ග්‍රාම නාමයක් සඳහන් වේ.[54] විල යන්නෙන් ස්වාභාවිකව නිර්මාණය වුණු ජලාශයක් හැඳින්වේ. එම ප්‍රදේශයේ පිහිටි ස්වාභාවික ජලාශයක් මුල් කරගෙන මේ නම නිර්මාණය වන්නට ඇත. අම්පාර "බඹරගස්තලාව ලිපියේ" "නගපවත හෙවත් නාග පබ්බත" යනුවෙන් ස්ථාන නාමයක් සඳහන් වේ.[55] නාග යන්න මුල් කරගෙන ස්ථාන නාම මෙන්ම පුද්ගලනාම ද මේ

යුගයේ නිර්මාණය වී ඇත. නාග නමින් සිටි මනුෂ්‍යය ගෝත්‍රයක් විසින් නාගයින් පූජාවට ලක් කළ හෝ නාගයින් බහුලව සිටි පර්වත ප්‍රදේශයක් කේන්ද්‍ර කරගෙන මේ නාමය නිර්මාණය වන්නට ඇත. සිතුල් පව්ව ලිපියක 'පශණදරියගමශි' යනුවෙන් සඳහන් වී ඇත. 'පාෂාණ ද්වාරිය ග්‍රාම' ලෙස මේ ගම සංස්කෘතයෙන් අර්ථ දක්වා ඇත.[56] පාෂණ හෙවත් පාෂාණ යනුවෙන් හඳුන්වන්නේ තද බවින් යුතු ගල් විශේෂයන් ය. එය සංස්කෘතයෙන් පාෂාණ ලෙස ද, පාළියෙන් පාසාන ලෙස ද, හෙලයෙන් පහන් ලෙසින් ද දක්වා තිබේ.[57] දිරිය හෙවත් ද්වාරිය යනු ප්‍රවේශ දොරටුවයි. ඒ අනුව විශාල පාෂාණ ස්ථරයෙන් යුතු හෝ කන්දක් සහිත ප්‍රදේශයකට ප්‍රවේශවන ස්ථානයක මේ ගම පිහිටා තිබෙන්නට ඇත.

විවිධ ගෝත්‍ර හා සම්බන්ධව ද, ප්‍රදේශ නාමයන් ගොඩනැගී ඇත. විශේෂයෙන් ආර්යසංක්‍රමණ සමග මෙරටට පැමිණි භාරතීය ගෝත්‍ර කණ්ඩායම් දිවයිනේ විවිධ පළාත්වල පදිංචි වී සිටි බවට ශිලා ලේඛනගත සාධක ලැබී තිබේ. මේ අතරින් වැදගත් තැනක් භරත නම් ජන ගෝත්‍රයට හිමි වී ඇත.[58] කෑගල්ල ලෙනගල ලිපියෙහි එන 'බතශ නගර' යන ස්ථාන නාමයෙන් බතගේ නගරය යන අර්ථය ගෙන දේ.[59] මෙහි සඳහන් බතශ යන්නෙන් භරත ගෝත්‍රය හඳුන්වන්නේ නම් මේ ලිපියෙහි සඳහන් බතශ නගරය භරතවරුන් වාසය කළ ඔවුන්ගේ නගරය ලෙස හැඳින්විය හැකි ය. කුරුණෑගල තෝරවමයිලෑව ලිපියෙහි 'බමනගර' යනුවෙන් සඳහන් වෙයි.[60] බම යන්න සංස්කෘත බ්‍රහ්ම යන්නෙන් නිර්මාණය වූවක් බව මහාචාර්ය පරණවිතාන දක්වා තිබේ.[61] ඉන්දියාවෙන් සංක්‍රමණය වූ ආර්යය කණ්ඩායම් අතර, බ්‍රාහ්මණ පිරිස් සිටි බවට මූලාශ්‍රවලින් තොරතුරු ලැබේ. මෙලෙස පැමිණි එක් බ්‍රාහ්මණ ගෝත්‍රික කණ්ඩායමක් පිහිටුවා ගන්නා ලද නගරය මේ නමින් හඳුන්වන්නට ඇත. සැස්සේරුව ලිපියක 'පරවවගම' නම් භරතවරුන්ට අයත් ගමක් පිළිබඳව සඳහන් වේ.[62] මෙයින් පැහැදිළි වන්නේ ස්ථාන නාම නිර්මාණය කිරීමේ දී තම තමන්ගේ ගෝත්‍රික නාම යෙදීමෙන් තමන්ගේ අනන්‍යතාව ප්‍රකාශ කරීමට උත්සාහ ගත් බවයි.

ආගමික අදහස් මිනිසා සමග තදින් බැඳී පවතී. මිනිසාගේ ජීවිතය කිසියම් අරමුණක් කරා මෙහෙයවීම සඳහා ආගමක් සතු හැකියාව ඉතා විශිෂ්ඨ ය. මේ අදහස මිනිසා තුළ කොතරම් තදින් මුල් බැස ගත්තේ ද යත් ක්‍රිස්තු පූර්ව හයවන සියවසෙන් පසු මෙරටට පැමිණි ආර්යයන් තම තමන් ඇදහූ ආගම හා සම්බන්ධ නම්, පුද්ගල නම් වශයෙන් ද භාවිත කළ අතර, ඒ සමග ම ඒවා ප්‍රදේශනාම ලෙස ද භාවිතා කිරීම ඇරඹෙන්නට විය. විශේෂයෙන් ම මේ කාලයේ පැවති බ්‍රාහ්මනාගම හා බුද්ධාගම සම්බන්ධ නාමයන් ප්‍රදේශනාමයන් ලෙස භාවිතා කළ අවස්ථාවන් කිහිපයක් සමකාලීන සෙල්ලිපිවලින් සොයා ගත හැකි ය. මූලිකව බ්‍රාහ්මනාගම සමග බැඳි සිටින දෙවිවරුන්ගේ නම් මේ සඳහා යොදාගෙන තිබෙන බව පැහැදිළිය. නිදසුනක් ලෙස කෑගල්ල යටහලෙන ලිපියක සඳහන්වන 'ශිවනගර' යන්න නිර්මාණය වීම සඳහා 'ශිව' නම් හින්දු දෙවියාගේ නම බලපා ඇත.[63] නැතහොත් මේ සඳහා 'ශිව' නම් වෛදික පුද්ගල නාමය හේතුවන්නට ඇත.

මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලංකාව තුළ සීඝ්‍රයෙන් බුදුදහම ව්‍යාප්ත වූ බවට ප්‍රධාන සාධකයක් ලෙස දිවයින පුරා ව්‍යාප්තව පවතින ශිලා ලේඛන දැක්විය හැකි ය. මේ සෑම ශිලා ලේඛනයක් ම කිරීමේ මූලික පරමාර්ථය ලෙන් පූජා කිරීමක් වැනි කිසියම් ආගමික කටයුත්තක්

පිළිබඳ දැනුම්දීම ය. අනුරාධපුර මහකපුගොල්ලෑව ලිපියෙහි 'තුබද' නම් ප්‍රදේශයක් පිළිබඳ සඳහන් වේ.[64] තුබ යනුවෙන් හඳුන්වනුයේ දාගැබයි. ඒ අනුව දාගැබ් සහිත ප්‍රදේශයක් හෝ දාගැබක් සහිත භූමියක් කේන්ද්‍ර කරගෙන මේ නාමය ඇතිවන්නට ඇත. එසේම අනුරාධපුර ගල්කන්දේ ගම ලිපියෙහි 'පියක පාශාන' යනුවෙන් සඳහන් වේ.[65] නිකලස් 'පියක පාශාන' යනු සිව්වන අග්ගබෝධි රජු විසින් පියන්ගල් පිරිවෙන කරවන ලද ප්‍රදේශය විය හැකි බව අනුමාන කරනු ලැබේ.[66] ඒ අනුව මේ ස්ථාන නාමය විහාරස්ථානයක් කේන්ද්‍ර කරගෙන නිර්මාණය වී තිබෙන බව විශ්වාස කළ හැකි ය.

මිනිස් ජීවිතය හා තදින් බැඳීගත් විෂය ක්ෂෙත්‍රයකි, නක්ෂත්‍රය. මුල් කාලයේ සිට ම මිනිසා තමාගේ කටයුතු නක්ෂත්‍රයට අනුව සිදු කිරීමට පෙළඹී ඇත. එමගින් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකිය යන විශ්වාසය ඔවුන් තුළ පැවතිම ඊට හේතුවයි. ඒ අනුව නැකත් ශාස්ත්‍රය හා සම්බන්ධ නම් පුද්ගලනාම වශයෙන් ද, ස්ථානනාම වශයෙන් ද භාවිත කර තිබෙන ආකාරය සෙල්ලිපි මගින් හඳුනාගත හැකි ය. හම්බන්තොට යාන්ගල ලිපියක සඳහන් 'අනුරාධගාම' යන්න මෙයට නිදසුනකි.[67] අනුර නැකතින් බිහිවූ ස්ථානයක් නිසා හෝ අනුරාධ නම් පුද්ගලයෙකු මුල් කරගෙන හෝ මේ ග්‍රාමයේ නම බිහි වන්නට ඇත.

ආර්ය සංක්‍රමණයන්ගේ සිට ශ්‍රී ලංකාවේ ආර්ථික සාමාජික පසුබිම සකස් වී ඇත්තේ කෘෂිකර්මාන්තය පසුබිම් කරගෙන ය. කෘෂි කටයුතු සඳහා මුලින් ගංගා නිම්න ආශ්‍රිතව පදිංචි වූ ආර්ය ජන කණ්ඩායම් ඉන් තරමක් පසුකාලීනව වැව් අමුණු ඉදිකරමින් ක්‍රමානුකූලව කෘෂි කර්මාන්තයේ නියැලී ඇත. අතීත ශ්‍රී ලංකාවේ සශ්‍රීකත්වයේ ප්‍රධාන පසුබිම වූයේ කෘෂි කර්මාන්තය යි. මේ හා සම්බන්ධ වැව්, අමුණු ඇල, කෙත් යනාදිය ජන ජීවිතයට ඉතා සමීප සාධකයන් ය. මෙවැනි සාධකයන් හි පවතින ප්‍රබලත්වය හේතුවෙන් ක්‍රිස්තු පූර්ව සමයේ දී ස්ථානනාම කෙරෙහි එම බලපෑම ද ලැබී ඇතිබව සෙල්ලිපි පරීක්ෂා කිරීමේ දී පැහැදිළි වේ. අනුරාධපුර නැට්ටුක්කන්ද ලිපියේ සඳහන් 'එරකපි' නම් ගම බිහිවීම සඳහා 'එරික වාපි' නම් වැවක් මුල් වී ඇත. අවුකන ලිපියක 'කඩපිවපි' යනුවෙන් සඳහන් වී ඇත. මෙයින් කඩවැව නම් වැවක් සහිත ප්‍රදේශයක් පිළිබඳ අදහසක් දෙයි. කඩවාපි කඩපි ලෙස සම්බන්ධ වී නැවත වපි යන්න එකතු වීමක් මෙහිදී දැකිය හැකි ය. පස්වන සියවයේ දී ධාතුසේන රජු විසින් කරවන ලද 'කලාවැව හෙවත් කාලවාපිය' මෙය විය හැකි ය. මහාවංශයේ සඳහන් වන්නේ ද 'කලා වැව භාගාර්ධය කරවූ බැවින්' යනුවෙන් වන නිසා[69] මෙම ලිපියේ සඳහන් 'කඩපිවපි' නූතන කලාවැවේ මුල් අවධිය ලෙස අනුමාන කළ හැකි ය. එම ස්ථානයේ ම තිබෙන තවත් ලිපියක 'ගජදබුතකවපි හමික' යනුවෙන් සඳහන් වී ඇත.[70] මෙය සී. ඩබ්. නිකලස් විසින් දක්වනු ලබන කලාවැව නිර්මාණයට දායක වූ කල්බුතක නම් වැව විය හැකි ය.[71] මිහින්තලය ලිපියක 'ලොණපි' යනුවෙන් සඳහන් වී ඇත.[72] එය 'ලෝණ වාපි' නම් වැව මුල් කරගෙන නිර්මාණය වී තිබේ.[73]

හඳගල ලිපියක 'අනුලපි වපි' යනුවෙන් නාමයක් සඳහන් වේ.[74] මේ වැවේ නම නිර්මාණය වීම සඳහා 'අනුලා' යන ස්ත්‍රී වාචී නාමය මුල් වී තිබේ. එහිම තවත් ලිපියක 'නක-නකරක වපි' යනුවෙන් සඳහන් වී ඇත.[75] 'නක' නම් නගරයේ එනමින් තිබූ වැවක් පිළිබඳව සඳහන් වේ. නකරක යනු නගර යන්න බව පරණවිතානයන් දක්වා ඇත.[76] නක නගරය පදවිය

ආසන්නයේ 'නාත්තරුම' නම් ප්‍රදේශය බව විශ්වාස කරයි. හඳගලට සැතපුම් විසිපහක් පමණ ඈතින් පිහිටි තම්මැන්නාකන්ද ශිලා ලිපියේ ද මෙම ස්ථාන නාමය සඳහන් වේ.[77] එහිම පිහිටි තවත් ලිපියක 'නකොදපිකවපි' යනුවෙන් වැවක් පිළිබඳව ද සඳහන් වී ඇත.[78]

මිහින්තලය රාජගිරිකන්ද ශිලා ලේඛනයක 'උපලවි' නම් ප්‍රදේශයේ වාසය කළ පිරිසක් පිළිබඳව සඳහන් වේ.[79] මෙය උපල නම් වැවක් කේන්ද්‍ර කරගෙන නිර්මාණය වන්නට ඇත. උපල යනු උපුල් හෙවත් තිල් මහනෙල් ය. තිල් මහනෙල් මලින් පිරිගිය වැවකට මේ නම ව්‍යවහාර කරන්නට ඇත. පුත්තලම ගල්ගේ ලිපියක 'කඩහලක වවි' නමින් සඳහන් වී ඇත.[80] පොම්පරිප්පුවේ සිට සැතපුම් අටක් පමණ ගිණිකොණ දිගින් පිහිටි නටඹුන් වූ වැව ලිපියේ සඳහන් වැව ලෙස හඳුනාගෙන තිබේ. රත්තපුර කිරිමකුළුගොල්ල ලිපියේ 'උපශොන-පි' යනුවෙන් ස්ථාන නාමයක් ගැන සඳහන් වේ. උපශොන නම් පුද්ගල නාමය මුල් කරගෙන නිර්මාණය වී ඇති බව පැහැදිලි ය. සැස්සේරුව ලිපියක 'මතිකවිලිපි' නම් ස්ථාන නාමයක් සඳහන් වී තිබේ.[81] මාතික යන්න වැවකින් විහිදෙන ඇළ මාර්ගයක් හැඳින්වීම සඳහා භාවිත වේ.

කෑගල්ල ලෙනගල සෙල් ලිපියක 'අනුඩිගම' යන ස්ථාන නාමය සඳහන් වේ.[83] මේ ලිපියේ සඳහන් පුද්ගලයින් රාජකීය තත්ත්වයෙන් සිටි ආර්ය පිරිසක් බව පැහැදිලි ය. එච්. සී. පී. බෙල් මේ නාමය හඳුනාගෙන ඇත්තේ අනුමගම යනුවෙනි.[84] සී. ඩබ්. නිකලස් ද අනුගමනය කර ඇත්තේ එම ක්‍රමය ම ය.[85] නමුත් පරණවිතාන එය නිවැරදි ආකාරයෙන් හඳුනාගෙන තිබේ. පශ්චාත් කාලීන ඉදිකිරීමක් හේතුවෙන් එම අක්ෂර ආවරණය වීම බෙල් එය අනුමගම ලෙස හඳුනාගැනීමට හේතුව වී ඇත. මේ ස්ථාන නාමය කෘෂිකර්මය හා බැඳුණු සශ්‍රීකත්වය සමග ගොනු වූ නාමයක් ලෙස සැලකේ. මෙය සශ්‍රීකත්වය, වර්ධනය යන අර්ථය සහිත පාලි අනුවෘද්ධි යන පදයෙන් බිහිවී ඇත. ඒ අනුව එයින් සශ්‍රීකත්වයට පත්වුණු හෙවත් සාරවත්ගම යන අර්ථය ගෙන දෙන බව පෙනේ.

ප්‍රදේශනාම නිර්මාණය වීමෙහිලා වෘත්තීය ශ්‍රේණි ද කිසියම් ආකාරයක බලපෑමක් කර තිබෙන බව පැහැදිලි ය. විශේෂයෙන් ම එම වෘත්තිය ශ්‍රේණියට අදාල ජන පිරිස් වාසය කළ ස්ථාන හැඳින්වීම සඳහා වෘත්තීය මුල් කරගෙන ස්ථාන නාම නිර්මාණය වී ඇත. අනුරාධපුර ගල්කන්දේගම ලිපියේ 'පෙහෙකර-ගම' යනුවෙන් සඳහන් වී තිබේ.[86] පෙහෙකර යනුවෙන් හඳුන්වන්නේ පේසකාර හෙවත් රෙදි විවීම, කැපීම කරන පුද්ගලයන් ය. වෙනම කුලයක් ලෙසින් පැවති මොවුන් සඳහා ගම්මාන තිබුණ බව විවිධ මූලාශ්‍රවල සඳහන් වේ. මෙහි සඳහන් පෙහෙකරගම ද එවැනි සාමාජිකයින් පිරිසක් සිටි ප්‍රදේශයක් බව පැහැදිලි ය.

සිතුල්පව්ව කොරවක්ගල ලිපියක 'තොටගමිය' යනුවෙන් ස්ථාන නාමයක් සඳහන් වී තිබේ.[87] 'තොට' යන පදය සංස්කෘත තිර්ථ හා පාලි තිත්ථ යන්නෙන් සිංහලයට ආවකි. මෙයින් අදහස් කරන්නේ ගංගාවක හෝ මුහුදේ යාත්‍රා නවතා තබන ස්ථානයක් හෝ මගීන් එගොඩ මෙගොඩ කරන ස්ථානයකි. මේ ලිපිය පිහිටි කොරවක්ගල සමීපයේ මැණික් ගඟ ගලාගෙන යන බැවින් මෙහි සඳහන් තොටුපල ඒහා සම්බන්ධ වන්නට ඇත. තොටුපලක් යනු ජලය හා සම්බන්ධ වෘත්තීය මධ්‍යස්ථානයකි. එම ක්‍රියාවේ යෙදෙන පුද්ගලයා තොටියා ලෙස හැඳින්විය

හැකි ය. කුරුණෑගල දෙල්විට එක් ලිපියක 'අබතොට' යම් ප්‍රදේශයක් පිළිබඳව සඳහන් වේ.[88] අබතොට යන්න පාළියෙන් අම්බතිත්ථ යන්නට සමාන වේ. තිත්ථ හෙවත් තොට යනු තොටුපලකි. ඒ අනුව මේ නම ද තොටුපලක් මුල් කරගෙන නිර්මාණය වී ඇත.

අම්පාර කොන්ගල ලිපියක 'අදකවක' යනුවෙන් සඳහන් වී ඇත.[89] මෙය පාලි හෝ සංස්කෘත භාෂාවෙන් පැමිණි පදයක් ලෙස පෙනේ. 'අදක' යන පදයට අර්ථ දෙකක් තිබේ. එකක් මාර්ගයක තිබෙන මඩ ගොහුරු සහිත ස්ථානය මෙයින් හඳුන්වන අතර[90] අනික රජයේ උසස් නිලධාරියෙකු වූ අධිකාරි හෙවත් අධ්‍යක්ෂ තනතුර හැඳින්වීම සඳහා ද සමකාලීන ශිලා ලේඛනවල අදක යන්න යෙදී ඇත. අම්පාර විහාරෙගල ලිපි දෙකක ම 'කතියුත ගමික' යනුවෙන් ස්ථාන නාමයක් සඳහන් වී තිබේ.[91] මෙහි කතියුතගම නමින් ප්‍රදේශ නාමයක් සඳහන් වේ. සංස්කෘතයෙන් කර්ණිකා ලෙසින් දැක්වෙන 'කති' යන්නෙන් ලේකම් යන අදහස ගෙන දේ. 'යුත' කොටසෙන් යුක්ත හෙවත් සම්බන්ධ යන අදහස උපදී. ඒ අනුව ලේකම්වරයෙක් විසින් පවත්වාගෙන ගිය ගමක් මේ නමින් හඳුන්වන්ට ඇත. අධ්‍යක්ෂ මෙන්ම ලේකම් තනතුර ද වෘත්තීන්ට සම්බන්ධ වේ. ඒ අනුව මේ නම් දෙක ම වෘත්තීය කටයුතු සම්බන්ධ කරගෙන නිර්මාණය වී ඇති බව පෙනේ.

සැස්සේරුව ලිපියක 'කනිකනටිය ගමික' යනුවෙන් සඳහන් වී ඇත.[92] 'කනික' යන පදය ලිවීමේ දක්ෂ පුද්ගලයෙකු නැතහොත් ලේඛනයේ දක්ෂ පුද්ගලයෙකු හැඳින්වීම සඳහා භාවිත කර තිබේ. ඒ අනුව 'කනිකනටිය' යනු ලේඛන කටයුතු හා සම්බන්ධ පුද්ගලයින් වාසය කළ හෝ වෘත්තියක් වශයෙන් ලේඛන කටයුතු කළ ශ්‍රේණියක් වාසය කරන ලද ප්‍රදේශයක් විය හැකි ය.

ස්වාභාව ධර්මයේ පවතින විවිධ ක්ෂේත්‍රයන් ස්ථානනාම නිර්මාණය වීම කෙරෙහි බලපා තිබෙන බවට සාධක හමු වී තිබේ. ස්වභාව ධර්මයේ දායාද වන, ශාක, සතුන් ආදී ක්ෂේත්‍රයන් මෙලෙස ඒ කෙරෙහි බලපා තිබෙන බව පැහැදිලි වේ. පුත්තලම තෝනිගල ලිපියෙහි 'අචගිරික තිශ පවත' හා 'අචනගරක' යනුවෙන් සඳහන් වී ඇත.[93] ගිරික හා පවත යනු පර්වතයකි. මෙහි සඳහන් ප්‍රදේශ නාම දෙකේ ම ඇති 'අච' යන්නෙන් හඳුන්වන්නේ 'අච්ච' හෙවත් වලසුන් ය. වලසුන් සිටි ප්‍රදේශය කේන්ද්‍ර කරගෙන බිහි වූ එම ස්ථාන හැඳින්වීම සඳහා එම නම භාවිතා කරන්නට ඇත. පිදුරංගල සෙල්ලිපියක 'ගැරඬිදාගම' යනුවෙන් සඳහන් වී ඇත.[94] උරග පවුලට අයත් සත්වයකු වන ගැරඬියා මුල්කරගෙන මේ ස්ථානනාමය නිර්මාණය වී ඇත. ගැරඬිගල ආදී වශයෙන් නූතනයේ ද ස්ථාන හැඳින්වීම සඳහා මෙයට සමාන නාමයන් යොදාගෙන තිබෙන බැවින් අතීතයේ ද එවැනි නම් ප්‍රදේශ හැඳින්වීම සඳහා කරන්නට ඇත. අම්පාර බඹරගස්තලාව සෙල් ලිපියක 'නග පවත' යනුවෙන් සඳහන් වී ඇත.[95] නාග යනු උරග පවුලට අයත් සත්වයෙකි. නාග යන්න මුල් කරගෙන ස්ථානනාම මෙන් ම පුද්ගලනාම ද විශාල ලෙස මේ යුගයේ භාවිතා කර තිබේ. නාගයා පූජනීය හා ගෞරවනීය සතෙකු ලෙස ජනතාව අතර සැලකුණ බැවින් ද නාග යනුවෙන් මනුෂ්‍ය ගෝත්‍රයක් සිටි බැවින් ද මේ නාමය බහුලව භාවිතා වන්නට ඇත. එම ගෝත්‍රිකයින් සිටි ප්‍රදේශයක් හෝ නාගයන් පූජාවට ලක්වූ පර්වති ප්‍රදේශයක් මුල් කරගෙන මේ නාමය නිර්මාණය වන්නට ඇත. එසේ නැතහොත් නාගයෙකුගේ ස්වරූපය ගත් පර්වතයක් මුල්කරගෙන මේ නාමය ඇතිවීමට පිළිවන.

ස්වභාව ධර්මයේ තවත් සුවිශේෂ ස්ථානයක් ශාඛවලට හිමි වේ. ජන ජීවිතය හා වඩාත් සමීප ශාඛ මුල්කරගෙන ප්‍රදේශනාම නිර්මාණය වී තිබෙන බව හඳුනාගත හැකි ය. මේ අතරින් අඹ ගසට වැදගත් තැනක් හිමි වී තිබේ. ත්‍රිකුණාමලය නාච්චියාරමලෙයි ලිපියක "අඹගම" නම් ප්‍රදේශයක් පිළිබඳව සඳහන් වී ඇත.[96] හම්බන්තොට මණ්ඩගල ලිපියක "අඹවෙලක" නම් ප්‍රදේශයක් පිළිබඳව සඳහන් වේ.[97] අඹගසින් බහුලව වැසී ගිය ප්‍රදේශයක් මේ නමින් හඳුන්වන්නට සිත් ඇත. කුරුණෑගල රන්කිරිමඩ සෙල්ලිපියක "අඹ නගරියාන" යනුවෙන් සඳහන් වී තිබේ.[98] "අඹ නගරය" නම් ප්‍රදේශයක් පිළිබඳව එහි සඳහන් වේ. සංස්කෘතයෙන් ආම්‍ර, පාලියෙන් අඹ යනුවෙන් යෙදෙන මේ ශාඛය හැඳින්වීමට හෙළයෙන් "අඹ" යන පදය යොදා ඇති අතර එය ඒ ආකාරයෙන් ම ස්ථානනාම සඳහා ද භාවිත කර තිබෙන බව පැහැදිළි වේ. කුරුණෑගල දෙල්විට සෙල් ලිපියක "අඹතොට" යනුවෙන් ද ස්ථාන නාමයක් සඳහන් වී තිබේ.[99] අඹ වෘක්ෂ බහුලව පැවති තොටුපලක් සහිත ප්‍රදේශයක් හැඳින්වීම සඳහා මේ නම භාවිත කරන්නට ඇත.

සිතුල්පව්ව දෙකුන්දරාවැව සෙල් ලිපියක "වනකගමිය" නම් ප්‍රදේශයක් පිළිබඳව සඳහන් වේ.[100] "වනක" යනුවෙන් හඳුන්වන්නේ වනාන්තරය යි. ස්වභාව ධර්මයේ වැදගත් ස්ථානයක් වනාන්තරවලට හිමි වේ. මේ ලිපියේ සඳහන් ගම්මානය වනාන්තරයක් සහිතව හෝ වනාන්තරයකට සමීපව බිහිවූ බව අනුමාන කළ හැකි වේ. ස්වභාවිකව නිර්මාණය වුණු ජලාශ හඳුන්වන්නේ "විල" යනුවෙනි. හෙනන්නේගල සෙල්ලිපියක "විලගම" යනුවෙන් සඳහන් ප්‍රදේශ නාමයක් දැක්වේ.[101] මේ නාමය නිර්මාණය වීම කෙරහි එම ප්‍රදේශයේ පිහිටි ස්වාභාවික ජලාශයක් බලපාන්නට ඇති බව අනුමාන කළ හැකි ය.

දේශීය ස්ථානනාමයන් පමණක් නොව භාරතීය ප්‍රදේශනාමයන් ද සමහර අවස්ථාවල දී සෙල්ලිපිවලින් හමු වේ. ඉන්දියාවෙන් ලංකාවට සිදුවූ සංක්‍රමණ හා දෙරට අතර පැවති වාණිජ සම්බන්ධතාවය මෙලෙස භාරතීය ප්‍රදේශ නාමයන් ලංකාව තුළ භාවිතා වන්නට හේතුවක් වන්නට ඇත.

ආර්ය සංක්‍රමණ හේතුවෙන් මෙරට භාවිතා වූ භාරතීය ප්‍රදේශනාමයක් අම්පාර හෙනන්නේගල ලිපියක සඳහන් වේ.[102] එම ලිපියේ කශබනගර යන ස්ථාන නාමය දැක්වේ. මෙය සංස්කෘතයෙන් කාශ්‍යප ලෙස ද හෙළයෙන් කසුබ් ලෙස ද අර්ථ ගන්වා තිබේ.[103] මේ ස්ථාන නාමය වඩාත් සමීප වන්නේ කාශ්‍යපනගර යන්නට නොව "කොසඹනගර" යන්නට ය. බුද්ධකාලීන ඉන්දියාවේ පැවති ප්‍රසිද්ධ නගරයක් වූ කොසඹෑනුවර හෙවත කෝසම්බිනුවර යන්න සමාන වන ආකාරයෙන් මේ ස්ථානනාමය යොදන්නට ඇති බව පැහැදිළි ය. ආර්ය සංක්‍රමණවලදී එම ප්‍රදේශයෙන් පැමිණි ජන කණ්ඩායම් තමන්ගේ මුල් බිම සිහිවීම උදෙසා එම නාමයම භාවිතා කරන්නට ඇති බව මෙයින් අනුමාන කළ හැකි ය.

"පරුමක බරුකචග මලහ..." යනුවෙන් සඳහන් සෙල්ලිපියක් කුරුණෑගල බගවාලෙන වේ.[104] මෙහි සඳහන් බරුකචග යන ස්ථාන නාමයෙන් භාරුකච්ඡ වරාය හැඳින්වෙන බව දක්වා තිබේ.[105] මේ ලිපියේ සඳහන් ප්‍රමුඛයා වන මාල නැමැත්තා එම වරාය සමග වාණිජ සම්බන්ධතා පැවැත්වූ නාවිකයෙකු ද වූවා විය හැකි ය. එසේ නැතහොත් භාරුකච්ඡ වරායාශ්‍රිත ප්‍රදේශයෙන් මෙරටට සංක්‍රමණය වූ පිරිසක් තම මුල් නිජබිම සිහිකරනු වස් එම ස්ථාන නාමය මෙහි ද භාවිත කළා විය හැකි ය.

34736

අනුරාධපුර අඩියාගල ලිපියක "හොජකටකස නවිකස පදග දිනි" යනුවෙන් සඳහන් වේ.[106] හෝජකටකයට යාත්‍රා කරන නාවිකයෙකු ප්‍රදානය කළ පියගැට පෙළක් පිළිබඳ ව කියවේ. හෝජකටක යන්න විග්‍රහ කරන පරණවිතානයන් මේ නම සඳහන් ලිපි දෙකක් ඉන්දියාවේ භාරුත්වලින් ලැබී ඇති බව පවසන අතර මෙමගින් සමහර විට ඉන්දියාවේ බිල්සා සමීපයේ හෝපාල්වල පිහිටි හෝජ්පුර හැඟවෙතැයි අදහස් කරයි.[107] මේ අනුව මෙය ඉන්දීය ස්ථාන නාමයක් බවත්, හෝජ්පුර සිට මෙහි පැමිණි යාත්‍රිකයෙකු ආරාමයක් උදෙසා පියගැටපෙළක් කරවීම මෙහි සඳහන් වන බවත් පැහැදිළි ය.

මෙවැනි ස්ථානනාමයන්ට අමතරව විවිධාර්ථයන් සපයන ස්ථානනාමයන් රාශියක් පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනවලින් හමු වේ. අවුකන එක් ලිපියක "පදගම" යනුවෙන් සඳහන්වී ඇත.[108] පදගම යන්නෙන් ප්‍රධානගම යන්න අර්ථවත් වන බව අනුමාන කළ හැකි ය. ඒ අනුව මේ ග්‍රාමයට ගම් කිහිපයක් අතරින් වැදගත් ස්ථානයක් හිමිව තිබුණු බව සැලකිය හැකි වේ. මිහින්තලයේ තිබෙන තවත් ලිපියක සඳහන් ස්ථානනාමයක් ද මේ අර්ථයට තරමක් සමානත්වයක් දක්වයි. එහි "කනගම" යනුවෙන් සඳහන් වේ.[109] "කන" යන්න වීරත්වය දැක්වීම සඳහා ද යොදන බව පරණවිතානයන් පවසා තිබේ.[110] එය එසේ වුවහොත් වීරත්වය යන තේමාව මුල්කරගෙන එම ගම බිහිවූ බව නිගමනය කළ හැකි ය. පුත්තලම තෝනිගල සෙල් ලිපියෙහි "තවිරිකිය නගරක" යනුවෙන් සඳහන් වී ඇත[111] තවිරිකිය නගර යන්න සංස්කෘතයෙන් "ද්වාරකීය නගර" වශයෙන් හැඳින්වෙන්නට ඇති බව පරණවිතානයන් අනුමාන කරයි.[112] "ද්වාර" යනු ප්‍රවේශයයි. එසේ නම් මෙයින් ප්‍රවේශ නගරයක් හඳුන්වන්නට ඇත. කිසියම් ප්‍රදේශයකට පිවිසෙන ස්ථානයක් පදනම් කරගෙන එම නගරයට "තවිරිකියනගර" යනුවෙන් යොදන්නට ඇත. දඹුල්ල සෙල්ලිපියක සඳහන් "උපරිකඩ"[113] නම් ප්‍රදේශනාමය ද ඉහත නම්වලට සමානත්වයක් දක්වයි. "උපරි" යනු ඉහළ හෙවත් උසස් යන අර්ථය ගෙන දේ. "කඩ" යන්නෙන් කොටස යන අදහස ඇතිවේ. ඒ අනුව මේ ස්ථානනාමය සහිත ප්‍රදේශය භූමියේ ඉහළ ම ප්‍රදේශයක තිබෙන්නට ඇත. නැතහොත් අනෙකුත් ප්‍රදේශයන්ට වඩා වැදගත් ස්ථානයක් හෙවත් උසස් තත්ත්වයක් හිමිවන්නට ඇත. දඹුල්ලේ ම තිබෙන තවත් ලිපියක "රකිතගම" යනුවෙන් සඳහන් වේ.[114] රකිත යන්නෙන් ආරක්ෂිත යන අර්ථය ගෙන දේ. ගමෙහි පැවති ආරක්ෂිත තත්ත්වය පදනම් කරගෙන එම ස්ථානනාමය යෙදෙන්නට ඇත. පදගම, කනගම, තවිරිකියනගර, උපරිකඩ, රකිතගම, යන ස්ථානනාමයන් සියල්ල ම පදාර්ථගත අර්ථයන් අනුව කිසියම් ආකාරයක සමානත්වයක් දක්වන බව පැහැදිළි වේ. මේ සියල්ලන්ගෙන් ම ලැබෙන මූලික අදහස වන්නේ මේ ගම් සියල්ලම කිසියම් ආකාරයකින් විශේෂයකින් යුතුව සලකා තිබෙන බව ය.

මේ ලිපියේ සඳහන් ග්‍රාම හා නගරනාමයන්ට අමතරව නිශ්චිතාර්ථයන් ලබාදීමට නොහැකි ස්ථාන නාමයන් කිහිපයක් ද හඳුනාගැනීමට පිළිවන. එබැවින් එම නම් සම්බන්ධයෙන් වඩාත් ගැඹුරින් විමර්ශණය කර බැලිය යුතු වේ.

මේ විමර්ශණයෙහි මූලික අදහස වූයේ ක්‍රි. පූ. තුන්වන සියවසේ සිට ක්‍රි. ව. දෙවන සියවස දක්වා වූ කාලය තුළ ලියවී තිබෙන පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනවල සඳහන්වන ප්‍රදේශනාමයන් හඳුනාගැනීමත්, එම නාමයන් කුමන අරුතක් සඳහා යොදා තිබේ ද යන්න වටහා ගැනීමත් ය.

34786

අතීතයේ පැවති ස්ථානනාමයන් හඳුනා ගන්නා ආකාරයත්, ඒවා යෙදීමේ දී අනුගමනය කළ විවිධ ක්‍රම පිළිබඳව ද මෙහි දී විමසුමට ලක් කෙරිණ. අනතුරුව ගම හා නගරය අතර පවතින වෙනස තේරුම් ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. අවසානයේ දී ප්‍රදේශනාමයන් ගෙන් ජනිත වන නිරුක්තීන් හඳුනා ගැනීමට උත්සාහ කරන ලදී. ඒ අනුව විවිධ තේමාවන් රාශියක් ස්ථානනාමයන් නිර්මාණයවීම කෙරෙහි බලපා තිබෙන බව හඳුනා ගැනීමට හැකි විය.

## ආශ්‍රිත ග්‍රන්ථ සඳහා කෙටි යෙදුම්


01. නිකලස්, සී. ඩබ්. - *පුරාතන හා මධ්‍යතන ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තරය*, සිංහල පරිවර්තනය, තිසර ප්‍රකාශකයෝ, දෙහිවල. 1979.

02. ම. ව. - මහාවංශය, හික්කඩුවේ ශ්‍රී සුමංගල, බටුවන්තුඩාවේ දේවරක්ෂිත සංස්කරණය, රත්නාකර පොත් ප්‍රකාශකයෝ, කොළඹ. 1969

03. ල. වි. වි. ල. ඉ. - *ලංකා විශ්වවිද්‍යාලීය ලංකා ඉතිහාසය*, කාණ්ඩය 1, භාගය 11, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලීය මුද්‍රණාලය, 1971.

04. ලියනගමගේ, ඒ. - *අනුරාධපුර යුගය*, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලීය මුද්‍රණාලය. 1964

05. ශ්‍රී. ල. ඉ. - *ශ්‍රී ලංකාවේ ඉතිහාසය*, 1 කොටස, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ. 1994.

06. *A. S. C. A. R.* - *Archaeological Survey of Ceylon, Annual Reports,* Department of Archaeology, Colombo.

07. *A. S. C. , 7th PR* - *Archeaological Survey of Ceylon, Seventh Progress Report* by H. C. P. Bell.

08. Bell, H. C. P. - *Report of the Keglle District* Government Printer. Colombo Reprint, 1990.

09. *C. A. L. R.* - *Ceylon Antiquary and Literary Register,* vol. III, Colombo.

10. *C. H. J* - *Ceylon Historical Journal,* vol II, Colombo.

11. *C. J.Sc. G.* - *Ceylon Journal of Science, Setion G.* Archaeology, Ethnology, etc. Colombo.

12. *E .Z.* - *Epigraphia Zeylanica*, Department of Archaeology, Colombo.

13. *In. Cey.* - *Inscriptions of Ceylon,* vol. I, Archaeological Survey, Colombo, 1970.

14. *J. R. A. S. (C.B) .* - *Journal of the Royal Asiatic Society* (Ceylon Branch), Colombo.

15. *J. R. A. S. (C.B) NS.* - *Jorunal of the Royal Asiatic Society* (Ceylon Branch), New Series, Colombo.

16. *U. C. R.* - *University of Ceylon Review,* Colombo.

## සටහන්

01. ලියනගමගේ. ඒ., 1961, පිටුව 34.
02. ල. වි. වි. ල. ඉ., කා 1 හා. 11 පිටුව 804.
03. ම. ව. පරි., 13 පෙළ 15 සිට.
04. ශ්‍රී. ල. ඉ., 1994 1 කොටස පිටුව. 17.
05. *E. Z.,* vol. part 11, no. 2.
06. *E. Z.* vol. part 11, no. 31.
07. *In, Cey.* vol. 1, p. 4 no. 46
08. ලියනගමගේ. ඒ., 1961, පිටුව 36-9.
09. ම. ව. පරි. 7, පෙළ 33.
10. ම. ව. පරි. 7, පෙළ 39.
11. ම. ව. පරි. 7, පෙළ 40-42.
12. ම. ව. පරි., පෙළ 43-5.
13. ම. ව. පරි., 10 පෙළ 75-105.
14. විජේසෙකර, එන්., 1960, පිටුව 67.
15. අමුණුගම. එස්., 1977, පිටුව 32.
16. ම. ව. පරි. 10, පෙළ 103.
17. ගයිගර්. විල්හෙලම්, 1969, පිටුව 67.
18. විජේසේකර. එන්., 1960., පිටුව 68.
19. අමුණුගම. එස්., 1977. පිටුව 32.
20. ම. ව. පරි. 09, පෙළ 10-11.
21. ම. ව. පරි. 10, පෙළ 77-102.
22. ගයිගර්. විල්හෙල්ම්, 1969. පිටුව 78-81.
23. ම. ව. පරි. 25, පෙළ 28.
24. *In. Cey.,* vol, I p. CXXV.
25. *In. Cey.,* vol. I p. 87 no. 1112.
26. *In. Cey.,* vol. I p. 84 no. 444.
27. *In. Cey.,* vol. I p 25 no. 315.
28. *In. Cey.,* vol. I p. 65 no. 837.
29. *In. C ey.,* vol. I p. 77 no. 138.

30. *In. Cey.*, vol. I p. 41 no. 538.
31. *In. Cey.*, vol. I p. 91 no. 1151.
32. *In. Cey.*, vol. I p. 8 no. 105.
33. *In. Cey.*, vol. I p. 2 no. 14.
34. *In. Cey.*, vol. I p. 3 no. 29.
35. *In. Cey.*, vol. I p. 91 no. 1152.
36. *In. Cey.*, vol. I p. 60 no. 192 .
37. *In. Cey.*, vol. I p. 98 no. 1215
38. *In. Cey.*, vol. I p. 48 no. 642.
39. *In. Cey.*, vol. I p. 48 no. 642.
40. *In. Cey.*, vol. I p. 95 no. 118.3
41. *In. Cey.*, vol. I p. 25 no. 315.
42. *In. Cey.*, vol. I p. 95 no. 1187.
43. *In. Cey.*, vol. I p. 34 no. 444.
44. A. C. p. , 446, In. *Cey.*, *vol.* I, p. 32 no. 406.
45. *In. Cey.* vol. I p. 32 no. 105.
46. Bell., H. C. P. 1990. p. 71, *In. Cey.*, vol. I 60 no. 792.
47. ම. ව. පරි. 7. ගාථා 43-7.
48. *In. Cey.*, vol. I, p. no. 112.
49. ASC 7 th PR p., 57, *In. Cey.* vol .p. 11 no. 138.
50. *In. Cey.* vol. I, p. 88 no. 1051-2.
51. නිකලස්., සී. ඩබ්., 1979. පිටුව 105.
52. *In. Cey.*, vol. I, p. 22 no. 284.
53. ACP, p. 446, *In. Cey.*, vol. I, p. 32 no. 406.
54. ACP, p. 446, *In. Cey.*, vol. I, p. 32. no. 406.
55. *In. Cey.*, vol. I, p. 40 no. 522.
56. *In. Cey.*, vol. I, p. 114.
57. *In. Cey.*, vol. I, p. 114.
58. *In. Cey.*, vol. I. p. 60 no. 787, *In. Cey.* vol. I p. 60 no. 797.
59. Bell. H. C. P.,1990. p. 70, *Cey.*, vol. I, p. 60 no. 786.
60. *JRAS (CB)* NS, p. 154, *In. Cey.*, vol. I, p. 81 no. 1037.

61. *In. Cey.,* vol. I, p. 116.

62. *In. Cey.,* vol. I, p. 79 no. 1013.

63. *In. Cey.,* vol. I, p. 61 no. 79 A.

64. *In. Cey.,* vol. I, p. 11 no. 135.

65. *In. Cey.,* vol. I, p. 14 no. 171.

66. නිකලස්. සී. ඩබ්., 1979. පිටුව, 199.

67. *In. Cey.,* vol. I, p. 53 no. 706.

68. ASC 7th PR 549, *In Cey.,* vol. I, p. 14 no. 168.

69. *U.C.R* VIII, p. 122, *In. Cey.,* vol. I, p. 91 no. 1151.

70. *U.C.R* VIII p. 122, *In. Cey.,* vol. I, p. 92 no. 1153.

71. නිකලස්. සී. ඩබ්. 1979. පිට 195

72. *E. Z* , vol, p. 210, *In. Cey.,* vol. I, p. 3 no. 29.

73. *In. Cey.,* vol. I p. 3.

74. *In. Cey.,* vol. I p. 89 no 1130.

75. *In. Cey.,* vol. I, 89 no. 1129, *CHJ*, p. 11. p. 221-4.

76. *In. Cey.,* vol. I, p. 112.

77. නිකලස්. සී., ඩබ්. 1979. පිටුව 195.

78. *In. Cey.,* vol. I, p. 89 no. 1132, *CHJ*, 11, p. 222-4.

79. *In. Cey.,* vol. I, p. 87 no. 112, *E. Z.* vol. V, P. 225.

80. *In. Cey.,* vol. I, p. 88 no. 1051-2.

81. *In. Cey.,* vol. I, p. 78 no. 1002.

82. *In. Cey.,* vol. I, p. 117.

83. Bell., H. C. P., 1990, p. 70, *In. Cey.* vol. I, p. 60 no. 786.

84 Bell., H. C. P., 1990, I, p. 76,

85. නිකලස්. සී. ඩබ්, 1979. පිටුව. 143.

86. *In. Cey.,* vol. I, p. 91, no. 11145.

87. *In. Cey.,* vol. I, p. 48, no. 642, *JRAS* (CB) NS II, p. 130-2.

88 *In. Cey.,* vol. I, p. 42 no. 547.

89. *CJSG* II, p. 216, no. I, *In. Cey.* vol. I, p. 69 no. 869.

90. *In. Cey.* , vol. I, p. 102.

91. *In. Cey.,* vol. I, p. 40, no. 530 and p. 41, no. 534.

92. *In. Cey.,* vol. I, p. 79, no. 1017.
93. *In. Cey.,* vol. I, p. 88, p 10 1051-2.
94. *In. Cey.,* vol. I, p. 76, no. 837.
95 *In. Cey.,* vol. I, p. 40, no. 522.
96. *In. Cey.,* vol. I, p. 3, no. 379.
97. *In. Cey.,* vol. I, p. 45, no. 596.
98 *In. Cey.,* vol. I, p. 75, no. 569 හා 962.
99. *In. Cey.,* vol. I, p. 68, no. 889.
100. *In. Cey.,* vol. I, p. 47, no. 619, *JRAS(CB) NS,* III, p. 124-30.
101. A.C.P. 446, *In. Cey.,* vol. I, p. 32, no. 406.
102. A.C.P. 446, *In. Cey.,* vol. I, p. 32, no. 406.
103. *In. Cey.,* vol. I, p. 32.
104. *ASCAR* 1933, p 17, *In. Cey.,* vol .I, p. 95, no. 1183.
105. *In. Cey.,* vol. I, p. xcix.
106. *In. Cey.,* vol. I, p. 8, no. 105.
107. *In. Cey.,* vol. I, p. cxxviii.
108. *In. Cey.,* vol. I, p 91, no, 1152.
109. *E. Z. vol.* I p. 210, In. Cey., vol. I p. 2, no. 14.
110. *In. Cey.,* vol. I, p. 105.
111. *In. Cey.,* vol. I, p. 88, no. 10552-2.
112. *In. Cey.,* vol. I, p. 109.
113. *In. Cey.,* vol. I, p. 65, no. 841.
114. *In. Cey.,* vol. I, p. 65, no. 840.